# දැන්වීමයි.

**වාහන වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල-මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වාහන වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලය පුරප්පාඩු තනතුරු සඳහා ද්විතීයන පදනම මත සංවර්ධන නිළධාරීන් බඳවා ගැනීම.**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ වාහන වායු විමෝචන වැඩසටහනේ පහත සඳහන් රාජකාරි ඉටුකරවා ගැනීම සඳහා ද්විතියන පදනම මත දැනට රාජ්‍ය සේවයේ නියුතු සංවර්ධන නිළධාරීන් බඳවා ගැනීමට සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- වාහන වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථාන අධීක්ෂණය සඳහා විගණණ නිළධාරියෙකු ලෙස කටයුතු කිරීම හා එම මධ්‍යස්ථාන වල පවතින දෝශ නිවැරදි කර ගැනීම සඳහා අවශ්‍ය පාර්ශව සමග කටයුතු කිරීම.
- මාර්ග පරීක්ෂණ, ස්ථානීය දුම් පරීක්ෂණ වැඩසටහන් සංවිධානය හා වාර්තා සැකසීම
- වාහන වායු විමෝචන පරිසර හිතකාමී හා ආරක්ෂාකාරීව රියපැදවීම සම්බන්ධයෙන් විවිධ ආයතන වල රියදුරන්/ප්‍රවාහන නිළධාරීන් පුහුණු කිරීම සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම හා සියළුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- වාහන වායු විමෝචන හා සම්බන්ධ පර්යේෂණ කටයුතු පිළිබඳව අධ්‍යනය කිරීම, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සැලසුම් කිරීම හා පර්යේෂණ සිදු කරන ආයතන හා සම්බන්ධීකරණය කිරීම හා අදාල වාර්තා ඇගයීම.
- පර්යේෂණ දත්ත හා සංසරණ වායු තත්ව දත්ත විශ්ලේෂණය කිරීම හා ඒ අනුව වාහන වායු විමෝචන වැඩසටහනේ ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම. සංඛ්‍යාලේඛන වලට අදාල තොරතුරු පවත්වාගෙන යාම හා දත්ත ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- ගරාජ් ශිල්පීන් දැනුවත් කිරීම දිවයින පුරා සියළුම තාක්ෂණ විද්‍යාල සම්බන්ධීකරණය කිරීම හා වැඩසටහන් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- ප්‍රගති සමාලෝචන හා අනිකුත් රැස්වීම් කැඳවීම හා ආදාල ආයතන සියල්ල සම්බන්ධීකරණය කිරීම, තාක්ෂණික උපදේශන මණ්ඩලයට සම්බන්ධීකරණය කිරීම හා අවශ්‍ය උප කමිටු රැස්වීම් සංවිධානය කිරීම.

**සංවර්ධන නිළධාරි (තනතුරු - 03)**

**අධ්‍යාපන සුදුසුකම් -:**

අ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් විසින් හෝ ප්‍රධානය කරනු ලැබූ පහත සඳහන් විශයන් වලින් එක් විශයයක් ඇතුලත්ව සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

- භෞතික විද්‍යාව/රසායන විද්‍යාව/ව්‍යවහාරික විද්‍යාව/පරිසර කළමණාකරණය/සංඛ්‍යානය/තොරතුරු තාක්ෂණය/ගිණුම්කරණය/ආර්ථික විද්‍යාව/මානව සම්පත් සංවර්ධනය/ ඉංජිනේරු තාක්ෂණවේදය

**1. වයස් සීමාව :**

අවු 22 ට නොඅඩු -අවු35 ට නොවැඩි විය යුතුය (රජයේ තනතුරු දරන්නන්ට මෙම වයස් සීමාව අදාල නොවේ)

**2. මාසික වැටුප :**

රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 03/2016 චක්‍රෙල්ඛයට අනුව MN 4-2016 වැටුප් පරිමාණයට හිමි වැටුප ගෙවනු ලබන අතර (ජිවන වියදම් දිමනාව හා රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.) මූලික වැටුපෙන් හතරෙන් එකක දීමනාවක් මාසිකව වායු විමෝචන භාරකාර අරමුදලෙන් ගෙවනු ලැබේ.

**3. තනතුරුවල ස්වභාවය:**

මෙම තනතුර වසරක කාල සීමාවක් සඳහා බඳවා ගැනීම සිදු කර අයදුම්කරුවන්ගේ කාර්යය සාධනය හා ව්‍යාපෘතියේ සේවා අවශ්‍යතාවය මත උපරිම වසර 03 ක කාලසීමාවක් සඳහා අලුත් කෙරේ.

**4. අයදුම්කිරීමේ ක්‍රමය:**

- ✓ උක්ත තනතුරු සඳහා අප විසින් ලබාදෙන ලද ආකෘති පත්‍රයට අනුව සකස් කරන ලද අයදුම්පත්‍ර යොමු කල යුතු අතර තනතුරු සඳහා අදාල අයදුම්පත්‍ර ආකෘති www.vet.lk වෙබ් අඩවියෙන් භාගත කල හැක.
- ✓ උපන්දිනය, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් තහවුරු කරන ලද ලියවිලි වල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.
- ✓ නිසි පරිදි සම්පූර්ණ කළ අයදුම්පත් **, ව්‍යාපෘති අධ්‍යක්ෂ, වාහන වායු විමෝචන ව්‍යාපෘති ඒකකය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, තැ.පෙ.අංක: 533-341 නාරාහේන්පිට, කොළඹ-05.** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2024. 07.31 දිනට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිම දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ✓ ලිපි කවරයේ වම්පස ඉහල කෙළවර ද්වීතියන පදනම මත වාහන වායු **විමෝචන ව්‍යාපෘති ඒකකයේ සංවර්ධන නිළධාරි තනතුරට බඳවාගැනීම ලෙස සඳහන් කර එවිය යුතුය.**
- ✓ මේ වන විටත් යම් ආයතනයක සේවය කරනු ලබන අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
- ✓ මූලික සුදුසුකම් පරික්ෂා කිරීමෙන් අනතුරුව තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරික්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ව්‍යාපෘති අධ්‍යක්ෂ ජනරාල්
වාහන වායු විමෝචන භාරකාර අරමුදල,